

(3)

## විධායක ජනාධිපති ධූරය

1972 සිට ක්‍රියාත්මක වෙමින් පැවති ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළු කරන ලද දෙවෙනි සංශෝධනය 1978 පෙබරවාරි 04 දින සිට ක්‍රියාත්මක වීම තුළින් ප්‍රතිෂ්ඨාපිත විධායක ජනාධිපති ධූරය 1978 දී සම්පාදිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ද ප්‍රධාන අංගය බවට පත් කෙරිණි. එපරිද්දෙන් ව්‍යවස්ථාපිත වී ඇති විධායක ජනාධිපති ධූරය පූර්ණ බලතල සහිත තනතුරක් විය. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 30 වන වගන්තිය ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා රජයේ ප්‍රධානියා ද, ආණ්ඩුවේ ප්‍රධානියා ද, විධායකයේ ප්‍රධානියා ද, සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා ද වන්නේ ය.

ජනාධිපතිවරණයෙන් ජය ගනු ලබන පුද්ගලයාට අවුරුදු හයක කාලසීමාවක් ජනාධිපති ධූරය දැරීමට ව්‍යවස්ථාවෙන් ඉඩකඩ සලසා දී ඇත.

## ජනාධිපතිවරයා සතු බලතල සහ වරප්‍රසාද

- පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු නොවූව ද පාර්ලිමේන්තුව හා සම්බන්ධ බලතල රාශියක් ජනාධිපතිවරයාට හිමි වේ. ජනාධිපතිවරයා අමාත්‍ය ධූරයක් දරන්නේ නම් පාර්ලිමේන්තුව තුළ දී ඡන්දය දීමේ අයිතිය හැර අමාත්‍යවරයෙකු සතු සෙසු සියලු බලතල ඔහුට හිමි වේ. ඒ හැරුණු විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් හැර පාර්ලිමේන්තුවෙන් ප්‍රතික්ෂේපිත වෙනත් ඕනෑ ම පනත් කෙටුම්පතක් ජනමත විචාරණයකට ඉදිරිපත් කොට සම්මත කරවා ගැනීමේ ව්‍යවස්ථාදායක බලය ද ඔහු සතු ව ඇත.
- විධායකයේ නායකයා ලෙස විධායක බලතල රාශියක් ද ඔහු සතු ව පවතී. ඉදිරියේ දී ඒ බලතල ගැන සාකච්ඡා කරමු,
- ජනාධිපතිවරයාට අධිකරණ බලතල කිහිපයක් ද හිමි වී ඇත,
- අග්‍රවිනිශ්චකාරතුමා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකරුවන් පත් කිරිම,
- අධිකරණ සේවා කොමිෂන් සභාව පත් කිරීම,
- ශ්‍රී ලංකාවේ කවර හෝ අධිකරණයකින් වරදකරු කරනු ලැබූ පුද්ගලයකු සම්පූර්ණයෙන් නිදහස් කිරිම, ඔහුට සමාව දීම, දඬුවම් ලිහිල් කිරීම හෝ කල් තැබීම වැනි අධිකරණ බලතල ඒ අතර ප්‍රධාන වේ.

**වෙනත් බලතල -**

**යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම, රාජ්‍ය උත්සවවල මුලසුන දැරීම, ජාත්‍යන්තර රැස්වීම්වල දී ජනරජය නියෝජනය කිරීම, ජන රජයේ මුද්‍රාව තබා ගැනීම, ජනරජයේ මුද්‍රාව තබා ඉඩකඩම් ඇතුළු දේපළ පවරා දීම, තානාපතිවරුන්, මහ කොමසාරිස්වරුන් හා තානාපති නියෝජිතයන් පත් කිරීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ සභාපති, සාමාජිකයන් හා විශ්ව විද්‍යාල කුලපතිවරුන් සහ උප කුලපතිවරුන් පත්කිරීම ජනාධිපතිවරයා සතු වෙනත් බලතල වේ. ඒ අනුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමා වටා බලතල සහ වරප්‍රසාද රාශියක් සංකේන්ද්‍රණය වී ඇති බව ඔබට පෙනෙනු ඇත.**


1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජනාධිපතිවරයා ලෙස පත් වන පුද්ගලයාට විරුද්ධ ව පෞද්ගලික තත්ත්වයෙහි ලා හෝ නිල තත්ත්වයෙහි ලා හෝ කිසි ම කරුණක් සම්බන්ධයෙන් කිසි ම අධිකරණයක නඩු පැවරීම කළ නො හැකි ය. මෙම තත්ත්වය ජනාධිපති සතු විශේෂ වරප්‍රසාදයකි.

## 1978 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පාර්ලිමේන්තුව හා එය සතු ව්‍යවස්ථාදායක බලය

1978 ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව ඒකමණ්ඩලීය ව්‍යවස්ථාදායකයකි. එහි නිල කාලය අවුරුදු හයකි. සමානුපාතික නියෝජන ක්‍රමයේ වරණීය ඡන්ද ක්‍රමය යටතේ නියෝජිතයන් තෝරා ගනු ලැබේ. මන්ත්‍රී සංඛ්‍යාව 225ක් වන අතර 196 දෙනෙකු දිස්ත්‍රික් පදනම යටතේ මහජන ඡන්දයෙන් ද 29 දෙනෙකු ජාතික ලැයිස්තුවෙන් ද තෝරා පත්කොට ගැනේ.

1972 සිට ජාතික රාජ සභාව ලෙස හැඳින්වූ ව්‍යවස්ථාදායකය 1978 සිට නැවත පාර්ලිමේන්තුව නමින් හැඳින්වේ.

## පාර්ලිමේන්තුවේ සංයුතිය



## ජනාධිපතිවරයා හා පාර්ලිමේන්තුව

පාර්ලිමේන්තුව කැඳවීම,
මංගල රැස්වීමේ මුලසුන හිමි වීම,
වාර අවසන් කිරීම,
පාර්ලිමේන්තුව විසුරුවා හැරීම යන කාර්යයන් ජනාධිපතිවරයාට පැවරී ඇති අතර ඒවා ඉටු කිරීමට ඔහු පාර්ලිමේන්තුවට පැමිණීමට නියමිත ය.

## පාර්ලිමේන්තුව සතු බලතල

1. නීති පැනවීමේ බලය
2. මුදල් පරිපාලනය
3. සංවර්ධන සැලසුම් යෝජනා කිරීම
4. අතුරු අය වැය සකස් කිරීම
5. විවිධ අමාත්‍යාංශවල කටයුතු ඒකාබද්ධ කිරීම

### ශිෂ්‍ය ක්‍රියාකාරකම්

1. 1978 ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව පිළිබඳ කරුණු රැස් කොට පොත් පිංචක් සකස් කරන්න.
2. ළමා පාර්ලිමේන්තුවක් පන්ති කාමරය තුළ පවත්වන්න. පාර්ලිමේන්තුවේ විවිධ තනතුරු කාර්ය සහ බලතල ප්‍රදර්ශනය වන කණ්ඩායම් ක්‍රියාකාරකමක යෙදෙන්න.
3. ගුරුතුමා /ගුරුතුමිය සමඟ පාර්ලිමේන්තුවේ රැස්වීම් වාරයක් නැරඹීමට අවස්ථාවක් යොදා ගන්න.

## අමාත්‍ය මණ්ඩලය හෙවත් කැබිනට් මණ්ඩලය

1. ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩලයේ නායකයා ය. ඔහු විසින් අගමැතිතුමා පත් කරනු ලබයි.
2. අමාත්‍ය මණ්ඩලයේ නායකයා ද වන ජනාධිපති විසින් ඇමතිවරුන් පත් කරනු ලබයි.
3. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් අතුරින් ඇමති මණ්ඩලය තෝරා ගනු ලැබේ.
4. අමාත්‍ය මණ්ඩලයට අයත් නොවන ඇමතිවරුන් ද පත්කිරීමට ජනාධිපතිට බලය ඇත.
5. කැබිනට් මණ්ඩල සංශෝධනය කිරීමේ බලය ජනාධිපතිතුමා සතු වේ.
6. ඕනෑම අමාත්‍යාංශයක් තමා වෙත පවරා ගැනීමේ අයිතිය ජනාධිපතිට ඇත.
7. ජනාධිපතිතුමාට නියෝජ්‍ය ඇමතිවරුන් ද පත් කිරීමේ බලය හිමි වී ඇත.
8. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා හා අමාත්‍යාංශ ලේකම්වරුන් ද ජනාධිපතිතුමා විසින් පත් කරනු ලැබේ.

## කැබිනට් මණ්ඩලයේ කාර්යභාරය

- පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීති ක්‍රියාත්මක කිරීම,
- අමාත්‍යාංශ අයවැය ඇස්තමේන්තු සකස් කිරීම,
- අතුරු අය වැය සකස් කිරීම,
- විවිධ අමාත්‍යංශවල කටයුතු ඒකාබද්ධ කිරීම,

යනාදිය කැබිනට් මණ්ඩලයට පැවරී ඇති ප්‍රධාන කාර්යයන් වේ.

**විවිධ අමාත්‍යාංශ භාරව විවිධ ඇමතිවරුන් ක්‍රියා කළ ද රටේ සමස්ත පාලනය සඳහා මුළු කැබිනට් මණ්ඩලය සාමූහිකව වගකීමට බැඳී සිටියි.**

## 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා අධිකරණය

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15, 16 පරිච්ඡේදවලින් අධිකරණයේ ව්‍යුහය සහ එය ක්‍රියාත්මක වන ආකාරය ගැන කියැවේ. නීතියේ ආධිපත්‍යය බලපවත්නා නිදහස් සමාජයකට ස්වාධීන අධිකරණයක් අත්‍යවශ්‍ය වේ. මහජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙන් ද යුක්තිය සාධාරණ ලෙස පසිඳලීමෙන් ද අධිකරණය කරන උදාර සේවය මත,බොහෝ දුරට රටක නීතියේ ආධිපත්‍යයත්, නිදහසත් ආරක්ෂා වන බව කිව හැකි ය.

1978 ව්‍යවස්ථාව අනුව අපක්ෂපාත අධිකරණයක් පවත්වා ගැනීමට යොදා ඇති විධිවිධාන රාශියකි. පහත දැක්වෙන්නේ ඒවායින් කිහිපයකි.

- ඉහළ උසාවිවල විනිශ්චයකරුවන් ජනාධිපතිතුමන් විසින් පත්කරනු ලැබේ.
- එහෙත් ඔවුන් තනතුරෙන් ඉවත් කිරීමේ බලය ජනාධිපතිතුමාට නොමැත.
- විනිශ්චයකරුවන් සේවයෙන් ඉවත් කළ හැක්කේ විෂමාචාර ක්‍රියාවක් මත පමණි,

  එබඳු කරුණක් මත වුව ද විනිශ්චයකරුවන් ඉවත් කිරීමට පාර්ලිමේන්තුවට නොපැමිණි මන්ත්‍රීවරුන් ද ඇතුළුව නියත බහුතරයේ කැමැත්ත අවශ්‍ය වේ.
- විනිශ්චයකාරවරුන්ට ඡන්ද බලය හැර අනෙක් දේශපාලන අයිතිවාසිකම් සීමා කර ඇත.

## අධිකරණයේ සංවිධානය

1. ශ්‍රේෂ්ඨාධිකරණය
2. අභියාචනා අධිකරණය
3. ආරම්භක උසාවි

ආරම්භක උසාවි

- මහාධිකරණය
- දිසා අධිකරණය
- පවුල් අධිකරණය
- මහේස්ත්‍රාත් අධිකරණය
- ප්‍රාථමික අධිකරණය

## ශ්‍රේෂ්ඨාධිකරණය

ජනරජයේ උත්තරීතර හා අවසාන අධිකරණ බලය හිමි උසාවිය ශ්‍රේෂ්ඨාධිකරණය යි.

මූලික අයිතිවාසිකම් සුරැකීම, ජනාධිපතිවරයාට එරෙහිව පවරන දෝෂාභියෝග පිළිබඳව පරීක්ෂා කිරීම, පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකරන්නන්ට විරුද්ධ ව කටයුතු කිරීම, ඡන්ද පෙත්සම් සම්බන්ධ පරීක්ෂා කිරීම මෙම අධිකරණයට අයත් කාර්ය සමහරකි.

## අභියාචනා අධිකරණය

පහළ අධිකරණ ආයතනවලින් දෙනු ලබන නඩු තීන්දුවලට එරෙහි ව ඉදිරිපත් වන අභියාචනා නඩු විසඳීමේ පූර්ණ බලය, අභියාචනා අධිකරණයට හිමි වේ.

අභියාචනා අධිකරණය සතු බලතල කිහිපයක් සොයා බලමු.

1. දඬුවම් ලිහිල් කිරීම හෝ වෙනස් කිරීම,
2. තීන්දුව දුන් අදාළ විනිශ්චය අධිකරණයට නියෝග නිකුත් කිරීමට හෝ නඩු විභාගය නැවත පැවැත්වීමට ආඥාවක් නිකුත් කිරීම,
3. මුල් නඩු තීන්දුවේ කැඳවූ සාක්ෂි මත අමතර සාක්ෂි කැඳවීම,
4. හබයාස් කෝපුස් ආඥා නිකුත් කිරීම යනාදිය අභියාචනා අධිකරණය සතු බලතල කිහිපයකි.

ආරම්භක උසාවි සියල්ලට ම කිසියම් ආකාරයක ආරම්භක නඩු විසඳීමේ බලය හිමි වී ඇත. නිදසුන් ලෙස

| | | |
|---|---|---|
| මහාධිකරණය | - | දේශීය ජලතීරයේ, ගුවනේ සිදු කළ වැරදි පිළිබඳ නඩු |
| දිසා අධිකරණය | - | සියලු ආකාරයේ සිවිල් නඩු |
| මහේස්ත්‍රාත් අධිකරණය | - | සියලු ආකාරයේ අපරාධ නඩු |
| පවුල් අධිකරණය | - | පවුල් ආරවුල් පිළිබඳ නඩු |
| ප්‍රාථමික අධිකරණය | - | වටිනාකම රු. 1500ට වඩා වැඩි නොවන නඩු, පළාත් පාලන ආයතනවල ආදායම් යනාදිය අය කර ගැනීම සම්බන්ධ නඩු. |

### අධිකරණ සේවා කොමිෂන් සභාව

- මහාධිකරණ විනිශ්චයකරුවන්ගේ පත්වීම් අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත ජනාධිපතිතුමන් විසින් කරනු ලබයි. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති ධූරය අග්‍රවිනිශ්චයකාරතුමා විසින් දරනු ලබන අතර ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකරුවෝ දෙදෙනෙක් එහි සාමාජිකත්වය දරති. එමඟින් විනිශ්චයකරුවන්ගේ අපක්ෂපාතීත්වය රැක ගැනීමට විධිවිධාන යොදා ඇත. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම අධිකරණ සේවා කොමිෂම වෙත පැවරී ඇත.

## දෝෂාභියෝගය

ජනාධිපති කුමන හේතුවක් සඳහාවත් උසාවියට කැඳවිය නොහැකි බව අප ඉහත දුටුවෙමු. එහෙත් ජනාධිපති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිශ්චිත ව දක්වා ඇති දුබලතාවකින් පෙළෙන බව හෝ එහි දක්වා ඇති වරදක් සිදු කොට ඇති බව හෝ හැගේ නම් ජනාධිපතිට විරුද්ධ ව ගත හැකි ක්‍රියා මාර්ගයක් ඇත. එය දෝෂාභියෝගය ලෙස හැඳින්වේ.

## සමථ මණ්ඩලය

ගමේ සුළු ආරවුල් විසඳීමට උපකාරී වන ආයතනයකි. විධිමත් අධිකරණ උසාවි පද්ධතියේ අංගයක් නො වේ. ගමේ පිළිගත් පුද්ගලයන්ගෙන් සමන්විත මෙම මණ්ඩලය ප්‍රදේශයේ පාසල් වැනි පොදු ගොඩනැගිලි සාකච්ඡා සභා පැවැත්වීමේ ස්ථානය ලෙස යොදා ගනී.

ආරවුල් ඇති වූ දෙපිරිස කැඳවීම, තම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම සාකච්ඡා කිරීම මඟින් දෙපාර්ශවයට ම කරුණු අවබෝධ කොට දී සාමදාන කිරීම සමථ මණ්ඩලය මඟින් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

ජනතාවගේ කාලය සහ ධනය ඉතිරිවීමටත් වෛරය සහ අමනාපකම් දුරලීමටත් මෙම සමථ මණ්ඩලය මඟින් ඉටු කරනු ලබන වැදගත් සේවය උපකාරී වේ.

## මූලික මිනිස් අයිතිවාසිකම්

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන ඡේදයේ මූලික මිනිස් අයිතිවාසිකම් විස්තර කොට ඇත.

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 -1 වගන්තියෙන් සංක්ෂිප්ත ව දක්වා තිබූ මූලික අයිතිවාසිකම් හා නන් වැදෑරුම් නිදහස පිළිබඳ ව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පුළුල් ව හා විස්තරාත්මක ව විග්‍රහ කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කොට ඇති මූලික අයිතීන් කිහිපයක් මෙසේ ය.

කථා කිරීමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස
නීතිය ඉදිරියේ සමානත්වයෙන් සැලකීමේ අයිතිය
වධ හිංසාවලින් මිදීමේ නිදහස
රැකියාවක් කිරීමේ අයිතිය
ආගමක් ඇදහීමේ නිදහස

1972 ව්‍යවස්ථාව මඟින් මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය වූ අවස්ථාවක දී ගත හැකි පියවර සඳහන් නො වී ය. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පැහැදිලි ව එවන් අවස්ථාවක දී ගත හැකි පියවර දක්වා ඇත.

මූලික මිනිස් අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ නීතියෙන් නියම කරනු ලබන සීමාවක් යටතේ ය.

පුද්ගලයාගේ පුද්ගලිකත්වය අගය කරමින් දුප්පත්, පොහොසත්, උගත්, නූගත් භේදයන් නොසලකා සැම දෙනාට ම එක හා සමාන ව එම අයිතීන් භුක්ති විඳීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉඩ සලසා දී ඇත.

මූලික මිනිස් අයිතිවාසිකම් භුක්ති විඳීමට බාධා ඇති වූ විට ගත හැකි පියවර

1. තමන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩ වූ අයෙකුට ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් තම අයිතිවාසිකම් ඉල්ලා සිටීමට පුළුවන.

2. රජයේ හෝ සංස්ථාවක සේවකයකුට තම අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී සේව්‍ය පක්ෂයෙන් බාධා පැමිණියහොත් පාර්ලිමේන්තු කොමසාරිස් හෙවත් ඔම්බුඩ්ස්මන් වරයාගේ සහාය ලබා ගැනීමට විධි විධාන සලසා ඇත.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම**

මූලික මිනිස් අයිතිවාසිකම් දැක්වෙන පින්තූර පුවත් පත්, සඟරා ආදියෙන් එකතු කොට කණ්ඩායම් ක්‍රමය යටතේ පංතිය තුළ ප්‍රදර්ශනය කිරීමට පෝස්ටර් නිර්මාණය කරන්න.

පාර්ලිමේන්තු කොමාරිස්වරයා "ඔම්බුඩ්ස්මන්"
(යුක්තිය පසිඳලන්නා - දුක්ගන්නාරාල තනතුර)

- මෙය 1978 ව්‍යවස්ථාවෙන් බිහි වූ නවාංගයකි. ජනාධිපතිතුමන් විසින් පාර්ලිමේන්තු කොමසාරිස් හෙවත් ඔම්බුඩ්ස්මන්වරයා පත් කරනු ලැබේ.
- මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම, පරිපාලන අසාධාරණකම් සහ අයථා පාලනයත් නිසා-මෙරට ජනතාවට විඳීමට සිදු වන හානිවලට සහන ලබා ගැනීම සඳහා දැනට පවත්නා අධිකරණ ප්‍රතිකර්ම ප්‍රමාණවත් නොවනවා මෙන් ම ඒ සඳහා මුදල් ද, කාලය ද බෙහෙවින් වැය වන නිසා, ඒ පිළිබඳ සාමාන්‍ය විභාගයක් පවත්වා ලැබෙන පැමිණිලි වාර්තා කිරීමට මෙවන් නිලධාරියකු පත් කිරීම සුදුසු වන්නේ ය. යනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිශෝධන කාරක සභාව පළ කළ වාර්තාවෙහි, පාර්ලිමේන්තු කොමසාරිස්වරයකුගේ අවශ්‍යතාව පැහැදිලි කොට ඇත.

## 1978 ව්‍යවස්ථාව යටතේ හඳුන්වාදුන් නව මැතිවරණ හා නියෝජන ක්‍රම

1. ජනාධිපතිවරණය
2. ජනමත විචාරණය
3. සමානුපාතික නියෝජන ක්‍රමය

## ජනාධිපතිවරණය

- ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිණිස පවත්වනු ලබන ඡන්ද විමසීමක දී මුළු මහත් ශ්‍රී ලංකාව ම එක ම ඡන්ද කොට්ඨාසයක් බවට පත් වේ.
- ප්‍රකාශිත වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් නියත බහුතරයක් ලබා ගන්නා අපේක්ෂකයා ජයග්‍රහණය කරයි. නියත බහුතරය යනු ප්‍රකාශිත වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් 50% ඉක්ම වූ ප්‍රමාණයකි.
- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ප්‍රථම ජනාධිපති ධූරයට පත් වූයේ ජේ. ආර්. ජයවර්ධන මහතා ය.

1978 දී සකස් කළ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව එවක බලයේ සිටි විධායක ජනාධිපතිවරයා, පළමුවන විධායක ජනාධිපති ලෙස පත් වීමට නියම විය. ඒ අනුව ජනාධිපතිවරණයක් නොමැති ව ම ජේ. ආර්. ජයවර්ධන මහතා ලංකාවේ පළමුවන විධායක ජනාධිපති ධූරයට පත් විය. එහෙයින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ප්‍රථම ජනාධිපතිවරණය පැවැත්වූයේ 1982 දී ය. එහි දී ජේ. ආර්. ජයවර්ධන මහතා ජනාධිපති ධූරයට යළි තේරී පත් විය.

1988 ජනාධිපතිවරණයෙන් තේරී පත් වූ ආර්.ප්‍රේමදස මහතාගේ අභාවය 1993 දී සිදු විය. එහෙත් ඒ වන විට ඔහුගේ ජනාධිපති නිල කාලය අවසන් ව නො තිබිණි. එහෙයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව ජනාධිපතිවරණයක් නොමැතිව එවක සිටි අගමැති ඩී. බී. විජේතුංග මහතා ජනාධිපති ධූරයට පත් විය.

## ජනමත විචාරණය

**ජනතාව සෘජුව ම ව්‍යවස්ථා සම්පාදනයට සහභාගි වන අවස්ථාවක් ලෙස ජනමත විචාරණය හඳුන්වා දිය හැකි ය. ජනමත විචාරණයක් පැවැත්වීම සඳහා තීරණය ගැනීමේ බලය ඇත්තේ ජනාධිපතිට ය.**

ජනමත විචාරණයක් පැවැත්වීමට අවශ්‍ය විධිවිධාන පාර්ලිමේන්තුව විසින් සම්පාදනය කළ යුතු ය.

මැතිවරණ කොමසාරිස් ඊට අනුකූල ව මධ්‍යස්ථ මැතිවරණයක් පැවැත්විය යුතු ය.

ජනතාවට එක් නිමිත්තක් සඳහා පමණක් තම අභිමතය "ඔව්" හෝ "නැහැ" ලෙස ප්‍රකාශ කිරිමට ඉඩ ප්‍රස්තාව සලසා දෙනු ලැබේ. වෙන්කොට හඳුනා ගැනීමට පැහැදිලි සංකේත දෙකක් යෙදිය යුතු අතර ජනමතය විචාරනු ලබන නිමිත්ත පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීම ඡන්ද කොමසාරිස්වරයා සතු වගකීම යි. ඡන්ද කොමසාරිස්වරයා ජනාධිපතිතුමාට ප්‍රතිඵල දැන්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ ආයු කාලය දීර්ඝ කිරීම සඳහා කලය සහ ලාම්පුව ලකුණ යටතේ 1982 පැවැත්වූ ජනමත විචාරණය මේ රටේ පැවැත්වූ එක ම ජනමත විචාරණය වේ.

**ජනමත විචාරණයේ දී පනත් කෙටුම්පතක් හෝ විධි විධානයක් හෝ යෝජනාවක් හෝ වශයෙන් ජනමත විචාරණයට ඉදිරිපත් කෙරෙන නිමිත්තට පක්ෂ ව ප්‍රකාශිත වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් නියත බහුතරයක් ලැබුණහොත් ජනාධිපතිවරයාගේ අත්සන තැබීමෙන් අනතුරු ව එය වලංගු නීතියක් බවට පත් වේ.**

## සමානුපාතික නියෝජන ක්‍රමය

සමානුපාතික නියෝජන ක්‍රමය ද 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දුන් නවාංගයක් විය.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පළාත් සභා මන්ත්‍රීවරුන් සහ පළාත් පාලන ආයතන සඳහා මන්ත්‍රීවරුන් තෝරා පත් කිරීම සඳහා වන සියලු මැතිවරණවල දී,සමානුපාතික නියෝජන ක්‍රමය යොදා ගනු ලැබේ.

- විශාල ඡන්ද කොට්ඨාස ක්‍රියාත්මක වීම මෙම ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණයකි. ඒ අනුව (උදාඃ- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා එක් දිස්ත්‍රික්කයක් ඡන්ද කොට්ඨාස ලෙස සලකනු ලැබේ.)
- ඡන්ද අපේක්ෂකයෝ කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් වෙති.
- විවිධ ඡන්ද කොට්ඨාසවලට තෝරා ගනු ලබන මන්ත්‍රීවරුන් සංඛ්‍යාව කල් තියා ම තීරණය කොට ඇත.
- ඡන්දය පාවිච්චි කිරීමේ දී අදාළ දේශපාලන පක්ෂයට තම ඡන්දය ද ලැයිස්තුවේ ඡන්ද දායකයාට දී ඇති අංක අනුව තමා කැමැති අපේක්ෂකයාට මනාපය ද සටහන් කරනු ලැබේ.
- මැතිවරණයේ දී ඒ ඒ පක්ෂයන් ලබා ගත් ඡන්ද සංඛ්‍යාවට අනුපාතික ව ඒ ඒ පක්ෂයට ආසන හිමි විය යුතු ය. ඒ ඒ අපේක්ෂකයා ලබා ගත් මනාප ප්‍රමාණය අනුව වැඩි ම මනාප ලැබූ අනුපිළිවෙළට මන්ත්‍රීවරුන් තෝරා පත් කිරීම ද සිදු වේ.
- සෑම ඡන්ද කොට්ඨාසයක ම බහුතර ඡන්ද සංඛ්‍යාව ලබා ගත් පක්ෂයට ප්‍රසාද ආසනයක් ද හිමි වේ.

ප්‍රකාශිත වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් 5%ක් ලබා නොමැති දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් මන්ත්‍රී තනතුරු ලබා දීමට නුසුදුසු ලෙස සලකා ඉවත් කෙරේ.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම්**

01. ගුරුතුමා/ ගුරුතුමියගේ උපදෙස් ලබා ගෙන ඔබගේ සාහිත්‍ය සංගමයේ විධායක මණ්ඩලය සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ තෝරා ගැනීමට කණ්ඩායම් ක්‍රියාකාරකමක යෙදෙන්න.

02. පහත දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

| සරල බහුතරය ඡන්ද ක්‍රමයෙහි | සමානුපාතික ඡන්ද ක්‍රමයෙනි |
|---|---|
| වාසි / අවාසි | වාසි / අවාසි |

## නිදහසින් පසු සංවර්ධනය සඳහා ගත් ක්‍රියාමාර්ග 1948 - 1977 දක්වා

1948 සිට බලයට පත් සෑම ආණ්ඩුවක් ම ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම උදෙසා විවිධ සැලසුම් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව අධ්‍යාපනය කෘෂිකර්මය, රාජ්‍ය ව්‍යවසාය, කර්මාන්ත, යටිතල පහසුකම් යනාදිය දියුණු කිරීම හා සමාජ සුබ සාධනය යනාදි ක්ෂේත්‍රවල විවිධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කොට ඇත. එම සංවර්ධනාත්මක පියවර මෙතැන් සිට සාකච්ඡා කරමු.